# 03 ටීකා සීපද අසමු

ටීකා සීපද ජනකවි අතර සුවිශේෂත්වයක් උසුලන කාව්‍ය විශේෂයකි. පැල් කවි, පතල් කවි, කරත්ත කවි, නෙළුම් කවි, පාරු කවි මෙන් ම ටීකා සීපද ද සිංහලයන්ගේ මුවගෙහි නිතර රැව්දුන් ආකාරය අපගේ ජනකවි සාහිත්‍යය පිරික්සීමේ දී පැහැදිලි වේ. විනෝදස්වාදය සඳහා නිර්මාණය වූ ටීකා සීපද ශ්‍රවණ මාධුර්යයෙන් සමන්විත වේ. මේවා හඳුනාගෙන මනාව ගායනය කිරීමටත්, ශ්‍රවණය කරමින් රසවින්දනයේ යෙදීමටත් ඔබට අවස්ථාව උදා කර ගත හැකි ය. එමගින් විනෝදස්වාදය ලැබීමට පමණක් නොව, අත්දැකීම් පුළුල් කර ගැනීමට ද ඔබට අවස්ථාව සැලසේ.

**පෙර කාලේ තැනූ පැල දැන් දිරාලා**
**එම කාලේ බැඳපු වැට ගොනු කඩාලා**
**පැල්පතේ ගොයම් රෑ රැක බලාලා**
**නිදිමතේ කියමු සීපද ගොතාලා**

**කැලේ ගිහින් ඉනි කැපුවා කැත්ත දනී**
**වෙලේ ගිහින් වැට බැන්දා නියර දනී**
**පැලේ ගිහින් පැල් රැක්කා පැදුර දනී**
**මෙදා යලේ වී නැතුවා දෙවියො දනී**

"ඔන්න සීයේ සීපද ඇහෙනවා."

"කඳුරුගහහේන පැත්තෙන් නේ ද ඇහෙන්නේ? එකත් එකට ම ඔය පුංචිරාල වෙන්ඩ ඕනෑ. මිනිහ එක්ක සීපද කියන්න ජගතෙක් අහල ගම් හතකවත් නැහැ. පුංචිරාල ඉන්නකොට පැල් රකින එක කජ්ජක්යැ?"

"ඒ ඇයි සීයේ ?"

"පුංචිරාල පැල් රකිනකොට බොහොම අගේට සීපද කියනවා නේ"

"පැල් රකිනකොට කවි කියන්නේ ඇයි සීයේ?"

"පැල් රකින එක ලේසි පහසු කටයුත්තක් නෙමෙයි. හේන පාළු කරන්ඩ සතා සීපාව ආපුවම උන් එළවන්ඩ තුන් ජාමෙ ම මදුරුවො තළ තළා නිදිමරාගෙන, හීතලේ ගැහි ගැහී ඉන්න එපායැ. ඉතින් ඒ වගේ වේලාවට නිදිමත, කම්මැළිකම යන්නත් එක්ක ඔය වගේ කවි කියනවා. පුංචිරාල රෑ එළිවෙනකම් වුණත් සීපද කියනවා. ඒ තරමට ම සීපද කටපාඩං"



"පුංචිරාල මාමා ඕවා ඉස්කෝලෙන් ඉගෙන ගත්තු ඒවා ද සීයේ?"

"නෑ මයෙ පුතේ''

"එහෙනම් කොහොම ද ඔය කවි ඉගෙනගෙන තියෙන්නේ?"

"වැඩිහිටියො කියනකොට අහගෙන මතක තියාගෙන"

"ඕන්න සීයේ ආයෙත් ඇහෙනවා."

**වාරේ වාරේ කියනවා විනා කොස් වාරෙ ද අඹ වාරෙ ද දෙල් වාරෙ ද**
**කොහෙන් ආ වාරයක් ද දන්නෑ**
**වාරේ නොදැන ආවා අපි කුරුන්දට**

**පාරේ පාරේ කියනවා විනා ඌවෙන් බින්තැන්නෙන් මඩකලපුවෙන්**
**අතු පාරකින් වැටුණු මොන මඩ ගොහොරු පාරකින් ද මන් දන්නෑ**
**පාරේ නොදැන බැස්සෙමු කටුගස්තොටට**

**මාලේ මාලේ කියනවා විනා රිදියෙන් රත්තරනෙන්**
**තඹෙන් ලෝකඩෙන් කළ මොන මාලයක් ද දන්නේ නෑ**
**මාලේ  කරලාපු අඟනක් එගොඩ සිට**

**හූරේ හූරේ කියනවා විනා අත්තා මුත්තා කිත්තා කිරිකිත්තා**
**කාලෙවත් තිබුණ මොන නෑ කමක් ද දන්නේ නෑ**
**හූරේ ඔරුව පැදපන් කීදෑය මට**

"පුංචිරාල මාමා දැන් කිව්වෙ මොකක් ද සීයේ? මම නම් මීට කලින් ඒවා  අහල නෑ."

"ඕවට කියන්නේ පුතේ ටීකා සීපද කියලා."

"ටීකා සීපද කියන්නේ මොනවට ද සීයේ?"

"පුතා අහලා තියෙනව ද අටුවා ටීකා ගැන?"

"අහල තියෙනවා ඒත් තේරුම දන්නෙ නෑ."

"අටුවා කියන්නේ තුන් පිටකයට ඇතුළත් පොත්වලින් තෝරාගත් යෙදුම් ආදිය සඳහා විස්තර වර්ණනා ලියලා තියෙන පොත්වලට. ජාතක අටුවාව, දම්පියාඅටුවාව ආදිය එබඳු පොත්."

"ඒවාට ද සීයේ අටුවා පොත් කියල කියන්නේ?"

"හරියට හරි පුතා."

"එතකොට සීයේ ටීකා කියන්නේ?"

"අටුවා පොත්වල තවදුරටත් පැහැදිලි කරන්න ඕන පදවලට සපයල තියෙන විස්තරවලටයි ටීකා කියන්නේ?"

"එහෙනම් ටීකා සීපදවලත් තියෙන්නේ පාදයෙන් පාදය විස්තර කරල දිග්ගස්සමින් සීපදය කියන එකයි."

"ඔව් පුතේ,

ඔය ටීකා සීපදේ කියාගෙන ගිය විදිහටයි ඒකෙන් කියවෙන අදහස්වලටයි මට නම් හිනාත් ගියා."

"මම අහල තියෙන ටීකා සීපදේ ඔය ටීකා සිපදේට වඩා වෙනස්."

"අනේ සීයේ ඒ ටීකා සීපදේ කියන්නකෝ."

**වාරේ වාරේ කියනවා විනා කොස් වාරයක් ද කජු වාරයක් ද**
**කොස්, දෙල්, කජු, අඹ, රඹුටන්, ජම්බු, මොර, හිඹුටු**
**මොන වාරයක් ද දන්නේ නෑ**

**වාරේ කුරුඳු අරගෙන මම යන කලට**

**පාරේ පාරේ කියනවා විනා අලින් ගිය පාරක් ද මුවන් ගිය පාරක් ද**
**කොටින් ගිය පාරක් ද**
**අලින්, කොටින්, මුවන්, වග වලසුන් ගිය පාරක් ද කියන්ට මම දන්නේ නෑ**

**පාර වැරදිලා ගියෙ කටුගස්තොටට**

**මාලේ මාලේ කියනවා විනා**
**රනින් කළ මාලයක් ද, රිදියෙන් කළ මාලයක් ද තඹෙන් කළ මාලයක් ද රනින් රිදියෙන් තඹෙන් කළ මොන මාලයක් ද කියන්ට මම දන්නේ නෑ**

**මාලේ කරලාපු අඟනක් එගොඩ සිට**

**හූරේ හූරේ කියනවා විනා අත්තගෙන් ආ නෑකමක් ද මුත්තගෙන් ආ නෑකමක් ද කිත්තගෙන් ආ නෑකමක් ද අත්තා මුත්තා කිත්තා කිරිකිත්තා සොලියා පාඩියා කාලේ ආ මොන නෑකමක් ද කියන්ට මම දන්නේ නෑ.**

**හූරේ ඔරුව පැදපන් කීය මෙගොඩට**

"සීයේ ඔය ටීකා සීපද දෙකෙන් කෝක ද හරි"

"දෙක ම හරි."

"කොහොම ද දෙක ම හරිවෙන්නේ"

"ඔය ටීකා සීපද කියන ඒවා හදපු කෙනෙක් නෑ. ඕවා ආවේ කටින් කට. ඒ කාලේ ඕවා ලියා ගෙන පාඩම් කෙරුවෙත් නෑ. සීපද කියනකොට සමහර තැනක වචනයක් දෙකක් අමතක වුණොත් ගැළපෙන වචනයක් දාගෙන කෙනෙක් ඒක කියවන්න පුළුවන්. අනෙක් සීපදවලට වඩා ටීකා සීපදවලට පහසුවෙන් ම ඒ වගේ වචන එකතු වෙන්න පුළුවන්. ඒ නිසා තමයි පුංචිරාල මාමගෙ ටීකා සීපදේට වඩා මගේ ටීකා සීපදේ වෙනස් වුණේ."

"මම හරි ආසයි පුංචිරාල මාමගෙන් මේ වගේ ටීකා සීපද අහල දැනගන්න."

"සමහරවිට අද හවස පුංචිරාල මේ පැත්තෙන් එන්ඩ බැරි නෑ."

"එහෙමනම් මට තවත් ටීකා සීපද ටිකක් අහගන්න පුළුවන් වෙයි."

"ඩිංගිරි මාමේ, ඩිංගිරි මාමේ"

"අන්න කියනකොට ම පුංචිරාල එනවා"

"පුංචිරාල ඔහෙං ඇඳිගත්ත නං"

"හා හොඳයි මාමේ"

"අපේ මුනුබුරා පුංචිරාලගේ වග කිය කියා හිටියේ"

"ඒ ඇයි මාමේ"
"ඊයේ රෑ පුංචිරාල කිව්ව ටීකා සීපද අහලා තවත් ටීකා සීපදයක් අහගන්න ඕන කියලා"

"සමන් පුතාටත් හොඳට සීපද කියන්න පුළුවන්නේ"

"ඔව් ඔව්, හරි උනන්දුයි ඒවාට"

"පුංචිරාල මාමේ ඊයේ රෑ කියපු ජාතියේ සීපදයක් කියන්ඩකෝ"

"සීපදයක් නේ ද?"

"ඔව්. ටීකා සීපදයක්"

**මහා උස්ගස් සම්බාරයක් මහා වැල් බානකින් පැටලුණා වාගේ**
**වෙළි වෙළි වෙළී නුඹෙ දෙපතුල ළඟට වෙළී**
**කච්චියක් සේලයක් කිරිකඩ රෙද්දක් ඇන්දූ වාගේ**
**රැලි රැලි රැලී නුඹෙ ඉණ වට තිබෙන රැලී**
**සපුමල් පිච්ච මල් හච්කෙන්ද මල් සීනිද්ද මල් බැන්දූ වගේ**
**මලි මලි මලී නුඹෙ කොණ්ඩෙට බඳින මලී**
**පාලමක් නැවක් පාරුවක් හම්බානක් පැද්දෙන්නා වාගේ**
**ඇලි ඇලි ඇලී නුඹ වෙත ළඳෙ මසිත ඇලී**

"ඒක හරි අගේ ඇති ටීකා සීපදයක් නේ"

"ඔව් ඔය වගේ ටීකා සීපද තව තියෙනවා"

"මාමා ආයෙ කවද්ද මේ පැත්තේ එන්නේ"

"තව දෙතුන් දෙහකින් ඇවිත් යන්න එන්නංකෝ"

"ඩිංගිරි මාමේ මම ගිහිං එන්නං"

"හා හොඳයි පුංචිරාල"

"සමන් පුතේ මම ගිහිං එන්නං"

"හා හොඳයි මාමේ"

**ලන්දකට වැදී හාවුන්ට ගෝණුන්ට මුවන්ට**
**ඉත්තෑවුන්ට උරුලෑවන්ට අලින්ට කොටින්ට**
**වලසුන්ට නයින්ට පොළඟුන්ට...**

(ඩිංගිරි මාමාගේ ටීකා සීපද හඬ ඈතට ඇදී යයි)

දැන් පුතාට තේරෙනවා ඇති ටීකා සීපද කියන්නේ මොනවා ද කියලා. සීපදයට පද හතරක් තියෙනවා. කවි කියන නමත් ඒවාට යෙදෙනවා. සමාජයේ පවත්නා නොයෙක් රැකියා හා කර්මාන්ත අනුව මේ කවි බෙද තියෙනවා. පැල් කවි, පාරු කවි, කරත්ත කවි, ආදි නම් ආවේ මේ විධියටයි. සීපදයට වඩා ටීකා සීපදය දිගයි. පද හතරකට වැඩිය තියෙනවා. ශබ්ද රසය තියුණු වන ආකාරයට මේ පද දිගට ඇදී යනවා. මේ විධියට ටීකා සීපද සිංහලයේ අගනා නිර්මාණ බව කියන්න පුළුවන්.

අරුත් පැහැදිලි කිරීම්

| | | |
|---|---|---|
| අත්තා | - | පියාගේ පියා |
| මුත්තා | - | අත්තාගේ පියා |
| පනත්තා | - | මුත්තාගේ පියා |
| කිත්තා | - | පනත්තාගේ පියා |
| කිරිකිත්තා | - | කිත්තාගේ පියා |
| එකත් එකට ම | - | නිසැක ව ම |
| කජ්ජක් | - | පහසු කාර්යයක්<br>අමාරු නොවන දෙයක් |
| ජගතෙක් | - | දක්ෂයෙක්/හපනෙක් |
| දෙතුන් දෙහකින් | - | දවස් දෙක තුනකින් |
| හතරවරිගේ | - | මවගේ මවුපිය පාර්ශ්ව දෙක සහ පියාගේ මවුපිය පාර්ශ්ව දෙක |
| හම්බානක් | - | යාත්‍රා විශේෂයක්, කුඩා ඔරු වර්ගයකි |
| හූරා | - | මස්සිනා |

## ක්‍රියාකාරකම 01

i. ටීකා සීපද හා සීපදවල පවත්නා විශේෂතා හඳුන්වන්න.
ii. ටීකා සීපදකරුවන් ශබ්ද රසය ඇති කිරීමට උත්සාහ ගත් ආකාරය පැහැදිලි කරන්න.
iii. ටීකා සීපද කීම එකිනෙකට වෙනස් වීමට තුඩු දුන් හේතු ලෙස දැක්විය හැකි කරුණු මොනවා ද?
iv. **'සීපදවලින් මෙන් ම ටීකා සීපදවලින් ද හෙළිවන්නේ ජන ජීවිතය හා ගැමි පරිසරය ආශ්‍රිත තොරතුරු ය'.** මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

## ක්‍රියාකාරකම 02

බිත්ති පුවත්පත සඳහා ටීකා සීපද පිළිබඳ ලිපියක් නිර්මාණය කරන්න.

පන්තිය කණ්ඩායම්වලට බෙදී එක් කණ්ඩායමක් සීපද ද අනෙක් කණ්ඩායම ටීකා සීපද ද තාලානුකූල ව ගායනය කරන්න. අනෙක් කණ්ඩායම් මේ දෙකෙහි සමානතා අසමානතා ගැන සාකච්ඡා කරන්න.

## ක්‍රියාකාරකම 03

**ක්‍රියා විශේෂණ**
ක්‍රියා පදයේ කිසියම් විශේෂත්වයක් හැඟවීමට විශේෂණ පද යෙදේ. මේවා ක්‍රියා විශේෂණ ලෙස හැඳින්වේ.

- **පහත සඳහන් යෙදුම් කියවන්න.**
  අගේට තියෙනවා
  බයෙන් ඉන්නවා
  තාලෙට කියනවා
  ආයෙත් ඇහෙනවා

මෙම යෙදුම්වල ක්‍රියා පදය සමග මුලින් තවත් පදයක් යෙදී ඇත. එම පදයෙන් ක්‍රියා පදය විස්තර කර ඇත. ක්‍රියා පදය තවදුරටත් විස්තර කිරීම සඳහා යෙදී ඇති හෙයින් මේ පද ක්‍රියා විශේෂණ නම් වේ.

- **පහත සඳහන් වාක්‍ය කියවන්න.**
  දුම්රිය **වේගයෙන්** ධාවනය වෙයි.
  නංගි **හෙමින්** ගීයක් ගයයි.
  අපි දේශනයට **හොඳින්** සවන් දුන්නෙමු.
  මෙහි වේගයෙන්, හෙමින්, හොඳින් යන පද ක්‍රියා විශේෂණ ලෙස යෙදී ඇත.

**පහත සඳහන් ක්‍රියා විශේෂණ පද සුදුසු ලෙස යොද වාක්‍ය සම්පූර්ණ කරන්න.**
**ප්‍රවේශමෙන්, පැහැදිලි ලෙස, ශීඝ්‍රයෙන්, වහ වහා, අනලස් ව, විශ්වාසයෙන්**

i. ගංවතුර උවදුර ........................................ පහවීය.
ii. ඔහු ................................... රිය පැදවී ය.
iii. ශිෂ්‍යයා පිළිතුර .................................... ඉදිරිපත් කළේ ය.
iv. ඔවුහු අනතුරට ලක්වූවන් ......................................... රෝහලට ගෙන ගියහ.
v. කම්කරුවෝ ......................................... තම කටයුතු ඉටු කරති.



නොමිලේ බෙදහැරීම සඳහා ය.